මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල

# රැකියා පුරප්පාඩු

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය වසර 16ක් වැනි කෙටි කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනය හා ලාභදායිත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. කළමනාකරු - ප්‍රතිරක්ෂණ සහ SRCC (HM 1-2)

**බාහිර අයදුම්කරුවන්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණ, පරිපාලන, විද්‍යාව, ගණිතය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම

**සහ**

පශ්චාත් උපාධියක් ලබාතිබීම

**හෝ**

පිළිගත් රක්ෂණ ආයතනයක ආයතනික සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership)

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක කළමනාකරණ ගණයේ 1 ශ්‍රේණියේ (MM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය** : HM1-2-2016-රු.81,670.00-15×2,270 -115,720

**වයස** : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට අදාළ නොවේ.

## 2. සහකාර කළමනාකරු - තොරතුරු තාක්ෂණ (MM 1-2)

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය /පරිගණක විද්‍යාව හෝ පරිගණක ඉංජිනේරු පිළිබඳ උපාධියක් ලබා තිබීම

   **සහ**

   උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

2. අදාළ ක්ෂේත්‍රය පිළිබඳ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් වෙතින් ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට (NVQ Level 7) නොඅඩු සුදුසුකමක් ලබා තිබීම **සහ**

   රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක අවම වශයෙන් වසරක පශ්චාත් සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අවම වශයෙන් වසර 05ක කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය** : MM1-2-2016-රු.54,550.00-10×1,375-15×1,910 - 96,950

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 3. සහකාර කළමනාකරු - සාමාන්‍ය රක්ෂණ (මෝටර් රථ සහ මෝටර් රථ නොවන) (MM 1-2)

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් රක්ෂණය සහ අවදානම් කළමනාකරණ/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය රක්ෂණය, වාණිජ්‍යය, මූල්‍ය, කළමනාකරණ හෝ අදාළ ක්ෂේත්‍රයේ වෙනත් මූල්‍ය සහ රක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අවම වශයෙන් වසර 05ක කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය** : MM1-2-2016 - රු.54,550.00-10×1,375-15×1,910 - 96,950

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 4. ප්‍රාදේශීය කළමනාකරු (MM 1-2)

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් රක්ෂණය සහ අවදානම් කළමනාකරණ/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය රක්ෂණය, වාණිජ්‍යය, මූල්‍ය, කළමනාකරණ හෝ අදාළ ක්ෂේත්‍රයේ වෙනත් මූල්‍ය සහ රක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අවම වශයෙන් වසර 05ක කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය** : MM1-2-2016 රු.54,550.00 - 10×1,375 -15×1,910 - 96,950

**වයස** : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 5. අවදානම් කළමනාකරණ ඉංජිනේරු (MM 1–2)

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් සිවිල් හෝ විදුලි ඉංජිනේරු පිළිබඳ උපාධියක් ලබා තිබීම

   **සහ**

   උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

2. අදාළ ක්ෂේත්‍රය පිළිබඳ, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් වෙතින් ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට (NVQ Level 7) නොඅඩු සුදුසුකමක් ලබා තිබීම **සහ**

   රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසරක පශ්චාත් සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.

**වැටුප් පරිමාණය** : MM1-2-2016 රු.54,550.00 - 10x1,375 -15×1,910 - 96,950

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම්** : මෙම පත්වීම් ස්ථිර පත්වීම් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**කොන්දේසි :**

**සියලුම අයදුම්කරුවන්,**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට හැකියාව පැවතිය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තිය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමඟ එවිය යුතුවේ. දැනටමත් රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතුවේ.
- අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල, නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට 2023.09.06 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු වේ.

  ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික රක්ෂණ භාර අරමුදල,**
**නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ 02.**